# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## ඇබෑර්තු

**සුළු ශ්‍රේණි**

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - රත්මලාන සහ දක්ෂිණ මණ්ඩපය - සූරියවැව

**01. විදුලි කාර්මික - II ශ්‍රේණිය**

වැටුප් පරිමාණය : U-PL3(III) Rs. 29,915 – 16x270 – 34,235 pm

අවම සුදුසුකම් :

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. කියවීමට හා ලිවීමට හැකිවීම.

2. අ. ට්‍රාන්ස්පෝමර්, සියලුම වර්ගයේ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වල වැරදි හඳුනාගෙන ඒවා අලුත්වැඩියා කිරීම සහ අමුද්‍රව්‍ය එකලස් කිරීම, විවිධ වර්ගයේ රැහැන් හා ඒවායේ වර්ග කිරීම්, මානක උපකරණ හා ඒවායේ භාවිතයන්, විවිධ වර්ගයේ විදුලි රැහැන් ඇදීම, මාපක සම්බන්ධ කිරීම, මාපක හා කුඩා ප්‍රමාණයේ ට්‍රාන්ස්පෝමර් පරීක්ෂා කිරීමට හැකියාව තිබීම.

   ආ. සටහන්, රූපසටහන් කියවීම සහ කියවා තේරුම් ගැනීම, මිනුම් කියවීම සහ අසම්පූර්ණ මිනුම් සටහන් කිරීමට හැකියාව තිබීම.

   ඇ. වෘත්තියට අදාල මෙවලම් උපකරණ භාවිතය හා පාලනය කිරීමට හැකිවීම.

3. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විදුලි කාර්මිකයෙකු වශයෙන් අවුරුදු 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**බාහිර අයදුම්කරුවන්**

1.ඉහත (1), (2) සහ (3) අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ සුදුසුකම් වලට සමාන වේ.

4.වයස අවුරුදු 40 නොඉක්මවිය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

**<u>පොදු කොන්දේසි</u>**

01. යහපත් චරිතයකින් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

04. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (https://kdu.ac.lk) භාගත කර ගත හැකි ආකෘති පත්‍රය මඟින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටින අතර ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.

06. පත්වීමේ සෙසු කොන්දේසි, 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන වලට අනුකූල වේ.

07. විශ්වවිද්‍යාල/ආයතන/රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල වල අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මගින් එවිය යුතුය.

08. උප්පැන්න සහතිකය, අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් සහතික සහ පළපුරුද්ද සම්බන්ධ වෙනත් සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

09. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කල යුතු අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2024.03.31